**මැදගම ප්‍රාදේශීය සභාව - 2023**

-------------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මැදගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ</u>

### 1.6.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයට අදාල රු. 815,344 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් සමාලෝචිත වර්ෂයට අදාල වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ඉකුත් වර්ෂයට අදාල රු. 1,625,344 ක ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ලැබීමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2024 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභාවට අයත් ස්ථාන 08 ක් සඳහා විදුලි සම්බන්ධතා ලබා ගැනීමට වැයකර තිබුණු රු. 266,980 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු රු. 240,390 ක කර්මාන්ත 05 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු සියළුම වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු ලී බඩු උපකරණ වටිනාකම රු. 661,875 ක් වුවත් එය රු. 588,611 ක් ලෙස රු. 73,264 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | අලෙවි නියෝජිත ආයතනය විසින් ලබාදුන් මිල ගණන්වලට අනුව අදාල ගෙවීම් කටයුතු සිදුකර ඇති බව. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. 17,000 ක UPS යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථයේ වහලය සකස් කිරීම සඳහා දරන ලද රු. 88,000 ක් දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (උ) ආදාහනාගාරයේ ගරාජය අසල පඩිපෙළ සැකසීම සඳහා දරන ලද වියදම රු. 22,140 ක් වුවත් එය රු. 78,300 ක් ලෙස රු. 56,160 ක් වැඩියෙන් ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) ප්‍රාදේශීය සභාවට ලැබී තිබුණු ජල ටැංකි 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාවට ලැබෙන වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාව සතු තොගයෙන් රු. 98,218 ක් වටිනා තොගයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් තොගයේ වටිනාකම අගය කර කොම්පෝස්ට් පොහොර තොග ගිණුමට ඇතුලත් කර නොතිබුණි. | කොම්පෝස්ට් තොග වටිනාකම් ඇතුලත් කිරීම සඳහා ලේඛනයක් නඩත්තු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඔ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණු මුදල රු. 6,695,727 ක් වුවත් රු. 7,042,662 ක් ලෙස සලකා ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලේඛනය අනුව තැන්පත් ශේෂය රු. 2,109,093 ක් වුවත් එය රු. 2,165,960 ක් ලෙස රු. 56,867 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ක) සභාවට එරෙහිව පවරා තිබුණු නඩු 03 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල හෙළිදරව් කිරීම් ඇතුලත් කරන බව. | අදාල හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ග) ගල්ඔය ගිමන්හල පිහිටි ඉඩමේ සහ කෝන්ගොල්ල බහුකාර්ය ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ තක්සේරු කිරීමෙන් පසු ඉඩම් ගොඩනැගිලි ලේඛනයට ඇතුලත් කරන බව. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකම හා උපලේඛනවල දක්වා තිබුණු වටිනාකම අතර රු. 49,237,421 ක වෙනසක් විය. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛන හා උපලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 1,476,191,557 ක් වූ වත්කම් විෂයයන් 06 කට අදාලව හිමිකම් ඔප්පු, තක්සේකරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන සහ යාවත්කාලීන වරිපනම් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කරන අතර අදියර වශයෙන් වෘත්තීය තක්සේරුවක් සිදුකර ගන්නා බව හා අනෙකුත් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන් තහවුරු කිරීමට අදාල ලේඛන, වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i) අංක 104(4) | 2019 සහ 2020 වර්ෂවල දී වාහන 02 කට අවස්ථා 02 ක දී සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | මූලික විමර්ශන කටයුතු සිදු කරමින් පවතින අතර විමර්ශන වාර්තාවට අනුව ඉදිරි කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ජුනි 28 දිනැති අංක 1816/43 දරන ගැසට් පත්‍රය | සභාව සතු පුස්තකාල 03 ක පාඨකයින් 6243 ක ගෙන් අය කළයුතු රු. 624,300 ක පුස්තකාල තැන්පතු මුදල් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ සිට පුස්තකාල සාමාජිකත්වය ලබා ගන්නා අයගෙන් රු. 100 ක පුස්තකාල තැන්පතුවක් අයකර ගන්නා බව. | ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ)1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වගන්තිය | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 120 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කරන බව. | යොමුගත චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2010 අගෝස්තු 17 දිනැති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය. | වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 690 ක් සවිකර තිබුණද, වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවීමට මහා සභාව වෙත යෝජනා කළ අතර මහ සභාව විසින් ගිවිසුම්ගතවීම ප්‍රතික්ෂේප කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,290,535 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,588,389 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 2,156,291 | 3,125,764 | 2,344,395 | 781,369 | 825,538 | 1,400,095 | 1,035,237 | 364,858 |
| (ii) | කුලී | 32,032,452 | 49,474,319 | 29,171,333 | 20,302,986 | 23,900,017 | 33,162,510 | 24,373,574 | 8,788,936 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 630,160 | 369,309 | 369,309 | - | 532,320 | 216,708 | 216,708 | - |
| (iv) | වෙනත් ආදායම් | 19,772,740 | 18,778,537 | 12,398,531 | 6,380,006 | 17,797,300 | 9,290,194 | 6,289,744 | 3,000,450 |
| | **එකතුව** | 54,591,643 | 71,747,929 | 44,283,568 | 27,464,361 | 43,055,175 | 44,069,507 | 31,915,263 | 12,154,244 |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| <u>**වරිපනම් හා බදු**</u><br>(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 1,277,903 ක් වූ වරිපනම් බදු ආදායමෙන් රු. 520,778 ක් හෙවත් සියයට 41 ක ප්‍රමාණයක් අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 174,011 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් රු. 91,285 ක් අයකරගෙන හෙවත් සියයට 52 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු හිමියන් ලිඛිතව දැනුවත් කර ඇති අතර තව දුරටත් නොගෙවන්නේ නම් අදාල දේපල තහනම් කිරීමට අපේක්ෂා කරන බව. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ඉකුත් වර්ෂවලට අදාලව දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 6,662,759 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 22,505,022 ක ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 11,322,815 ක් අයකරගෙන නොතිබුණි. | බදුකරුවන් විසින් තබා ඇති ආරක්ෂිත ඇප තැන්පත්වලින් හිඟ මුදල් පියවා ගැනීමටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | බිල්කල ආදායම් අයකර ගත යුතුය. |

<u>කුලී</u>

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 6,098,250 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 1,300,625 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට නිලධාරීන් දැනුවත් කළ බව. | බිල්කළ ආදායම අයකර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 2,120,390 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් රු. 1,016,785 ක් හෙවත් සියයට 48 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙය කොවිඩ් වසංගතය හේතුවෙන් කඩහිමියන්ට සහන සැලසීම වෙනුවෙන් කපා හැරීමට තීරණය කළ හිඟ ශේෂයන් වන අතර ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලද පසු කපා හැරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

<u>බලපත්‍ර ගාස්තු</u>

| | | |
|---|---|---|
| (අ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා වන මාර්ගෝපදේශයේ 2.5.2 වගන්තිය අනුව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව ලෙස අයකරනු ලබන මුදල් බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පවත්වා ගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදී 2.37 ආදායම් ශීර්ෂය යටතේ පරිසර බලපත්‍ර හා පරීක්ෂණ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයේ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර බලපත්‍රවල වලංගු කාල සීමාව අවසන් වූ කර්මාන්ත 35 ක් සඳහා නැවත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍රවල වලංගු කාලය අවසන් වූ කර්මාන්ත හිමියන්ට ඒ පිළිබඳ ලිඛිතව දන්වා යවා ඇති බව. | සභා බලප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත නියාමනය කළ යුතුය. |

**<u>වෙනත් ආදායම</u>**

| | | |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු. 514,140 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 104,083 ක් සහ මුද්දර ගාස්තු රු. 5,761,782 ක් ලබාගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල හෙල බොජුන්හල් සඳහා දේශීය ආහාර වර්ග පිළියෙල කිරීමට සහ තල්කොළ ආශ්‍රිත නිර්මාණ කිරීමට කාන්තාවන් 50 ක් පුහුණු කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු. 250,000 ක ප්‍රතිපාදන එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නැවත හරවා යවා තිබුණි. | ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමත් සමඟ එක් මන්ත්‍රීවරියක් විසින් ලබාදුන් ව්‍යාපෘති වාර්තාව ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම හේතුවෙන් එම මුදල් ඌණව පළාත් ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවූ බව. | ප්‍රතිපාදනය අදාල කාල පරිච්ඡේදය තුලදී ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයෙන් පසුව වරිපනම් බදු තක්සේරුවක් සිදුකර නොතිබුණි. | 2015 වර්ෂයේ සිදුකළ වරිපනම් බදු තක්සේරුව කොවිඩ් වසංගතය හේතුවෙන් 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ බවත් නැවත තක්සේරුව 2028 වර්ෂයේ සිදුකිරීමට යෝජිත බව. | වරිපනම් බදු කාලීනව තක්සේරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවට අයත් වාහන 02 ක් වසර 05 කට වැඩි කාලයක සිට අක්‍රීයව පවතින අතර එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහනවල ලියාපදිංචි අංක නොමැති බැවින් ඒවා අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට නොහැකි අතර මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | කාලීනව වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 08 හි 6.2.2 ඡේදය අනුව ජාතික තරඟකාරි ලංසු කැඳවීමකදී අවම වශයෙන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවත් 2023 වර්ෂය සඳහා බදුදීමට අදාලව ලංසු ඉදිරිපත් කිරීමට දින 15 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන චක්‍රලේඛය අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදුකළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මැදගම ප්‍රාදේශීය සභාවට අයත් ළමා උද්‍යානය සඳහා ආරක්ෂිත දැල් වැඩ ඉදිකිරීමේ කර්මාන්තයේ ඉටු නොකළ වැඩ ඝණ මීටර් 1.67 ක් සඳහා රු. 46,250 ක් ගෙවීම් කර තිබුණි. | අදාල මුදල කොන්ත්‍රාත්කාර සංවිධානයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 05 ක සේවකයින් 07 ක ගේ පුරප්පාඩු සහ තනතුරු 02 ක නිලධාරීන් 11 ක ගේ අතිරික්තයක් පැවතුණි. | අදාල පුරප්පාඩුවලට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කර ඇති අතර අතිරික්තතා අනුමත කර ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කර ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට, අතිරික්තතා අනුමත කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 5 සිට සියයට 205 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 06 සිට සියයට 252 දක්වාද විචලනයන් පැවතුණි. | ඉදිරි අයවැය සැකසීමේදී වඩා සැලකිලිමත් ලෙස ආදායම් හා වියදම් පුරෝකථනය කර වඩා සාධාරණ අගයන් ඇසතමේන්තු කිරීමට අවධානය යොමු කරන බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බලප්‍රදේශය තුල එකතු කරනු ලබන කසල කරමැටිය ප්‍රදේශයේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමකට බැහැර කරනු ලබන අතර එම ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණු අතර කසල බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි. | අදාල ඉඩම වන සංරක්ෂණ දොපර්තමේන්තුවට අයත් වන අතර වාර්ෂික අවසර පත්‍රයක් ලබාගෙන ඇති බව හා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති බව. | කසල බැහැර කිරීම විධිමත්ව සිදුකළ යුතුය. |